සැ. යු.- මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,682 - 2010 නොවැම්බර් මස 26 වැනි සිකුරාදා - 2010.11.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1908 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1909 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 දෙසැම්බර් මස 03 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 නොවැම්බර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

**පළාත් සභා නිවේදන**

**සබරගමුව පළාත තුළ නීතිමය ගැටළුවලට බඳුන් වන ළමුන් සඳහා රැඳවුම් නිවාසයක් (පිරිමි) ස්ථාපිත කිරීම**

වර්ෂ 1939 අංක 48 දරන ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනතේ සංශෝධිත පනත වන 1978 අංක 02 දරන පනතේ 52 වැනි වගන්තියේ (3) වන උපවගන්තිය හා වර්ෂ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 (1) "අ" වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා පිළිබඳ අමාත්‍ය ගෝනගල මනන්නලාගේ කරුණාපාල වන මම වර්ෂ 2010 ජූලි මස 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 123 බටංගල ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ මුරුත්තෙට්ටුව, බුදුහැරැස්සගම ග්‍රාමයේ ළමා රැඳවුම් නිවාසයක් ස්ථාපිත කොට පවත්වාගෙන යන බවට මෙයින් කාරුණිකව දැනුම් දෙමි.

ජී. එම්. කරුණාපාල,
අමාත්‍ය,
සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක,
ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.

2010ක් වූ ජූලි මස 22 වැනි දින.

11-610/1

---

**සබරගමුව පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

පරිවාස නිලධාරීන් පත් කිරීම

1944 අංක 42 දරන වරදකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥාපනතේ 18 (3) වගන්තිය යටතේ I තීරුවේ සඳහන් පරිදි පරිවාස නිලධාරීන්ගේ නමට ඉදිරියෙන් ඇති II තීරුවේ සඳහන් අධිකරණ කොට්ඨාශවලට III තීරුවේ සඳහන් දින සිට පත්කර ඇති බව මෙයින් දන්වමි.

I *ශ්‍රේණියේ පරිවාස නිලධාරීන් :*

| *අනු. අංකය* | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|---|
| | *නම* | *අධිකරණ කොට්ඨාසය* | *දිනය* |
| 01 | පී. එන්. ධර්මසිරි මිය | රත්නපුර, කලවාන | 2008.01.01 |
| 02 | ඩබ්ලිව්. වීරසිංහ මයා | පැල්මඩුල්ල, රක්වාන | 2008.01.01 |
| 03 | කේ. ආර්. එන්. සමරතුංග මිය | කෑගල්ල | 2008.01.01 |
| 04 | එම්. ඩී. නිර්මලා රූපසිංහ මිය | රත්නපුර, කලවාන | 2008.01.01 |
| 05 | ආර්. ඒ. අශෝක රණතුංග මයා | ඇඹිලිපිටිය | 2009.08.01 |
| 06 | ජේ. එම්. වසන්ත කුමාර ජයසේකර මයා | ඇඹිලිපිටිය | 2008.10.20 |
| 07 | එස්. සී. ආටිගල මෙනවිය | බලංගොඩ | 2008.10.20 |
| 08 | ජේ. එම්. එස්. එස්. බී. ජයසුන්දර මයා | වරකාපොල | 2008.12.01 |

II *ශ්‍රේණියේ පරිවාස නිලධාරීන් :*

| *අනු අංකය* | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|---|
| | *නම* | *අධිකරණ කොට්ඨාශය* | *දිනය* |
| 01 | ඒ. එම්. එල්. කුමාරි රණවීර මිය | පැල්මඩුල්ල | 2009.07.15 |
| 02 | ජේ. එම්. එල්. එස්. බණ්ඩාර මයා | බලංගොඩ | 2009.08.03 |

දිලිනි ධර්මදාස,
පරිවාස හා ළමාරක්ෂක සේවා,
පළාත් කොමසාරිස්,
සබරගමුව පළාත.

2010 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,
සබරගමුව පළාත් සභාව,
නවනගරය, රත්නපුර.

11-610/2

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ලංසු කැඳවීමේ දැන්වීම

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය

**සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත**

***මහනුවර, මාතලේ, නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් රෝහල් සඳහා කිළිටි රෙදි සේදීම - 2011***

*සේවය සඳහා ලංසුකරුවන්ගේ සුදුසුකම්.*- 2011 ජනවාරි මස 01 දින සිට 2011 දෙසැම්බර් මස 31 වන දිනෙන් (මෙම දින දෙක ඇතුලත්ව) අවසන් වන වර්ෂය තුළ මෙහි පහත සඳහන් වන අංක 1,2 සහ 3 වන උපලේඛන වල පලවෙනි තීරුවේ දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගෙන් හා ශ්‍රී ලාංකික සමාගම් විසින් එවනු ලබන මුද්‍රා තබන ලද ලංසුපත් මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් භාර ගනු ලැබේ.

(i) *ලංසු පෝරම ගාස්තු හා ලංසු තැන්පත් මුදල.* - මෙහි 1, 2 සහ 3 උපලේඛනයන්හි දෙවැනි තීරුවේ සඳහන් නියම කරන ලද ගාස්තු මහනුවර තැ. පෙ. 163, සංඝරාජ මාවතේ පිහිටි මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මුදල් සහකාර වෙත මුදලින් ගෙවා කුවිතාන්සියක් ලබා ගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිතියේ හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත්ව අනුමත සමිතිවලට තැන්පත් මුදල් නොමැතිව ලංසු පත්‍ර නිකුත් කරනු ලැබේ. එවැනි ඉල්ලීම් කරන විට ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචිය සනාථ කළ යුතු වේ.

*අනුමත සමිති.*- *(අ)* සමෘද්ධි බලකාය

*(ආ)* විවිධ සේවා සමුපාකාර සමිති

*(ඇ)* ග්‍රාම සංවර්ධන සමිති

*(ඈ)* ලියාපදිංචි ගොවි සංවිධාන

(ii) *ලංසු පත්‍ර.*- ලංසු පත්‍ර 2010 දෙසැම්බර් මස 22 දින ප. ව. 2.30 දක්වා ලංසු පෝරම ලබාගත හැකිය. නියමිත පෝරමයන්හි ඉදිරිපත් නොකරන ලංසුපත් භාර ගනු නොලැබේ. ලංසු පෝරම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ලබා ගන්නා කුවිතාන්සිය සමග ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

02. දල වශයෙන් මාසයකට සේදිය යුතු කිළිටි රෙදි කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයේ පස්වෙනි තීරයේ දක්වා ඇත. කෑල්ලකට ඉදිරිපත් කරන මිල මත අවම ලංසුව තෝරා ගනු ලැබේ. (මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී විශාල (මීටර් 2කට වැඩි) මධ්‍යම (මීටර් 1-2 අතර) හා කුඩා (මීටර් 1ට අඩු) ප්‍රමාණයේ කෑල්ලක් සේදීමට අය කරන මිලගනන් වෙන වෙනම සඳහන් කළ යුතුය.)

03. *ලංසු එවිය යුතු අන්දම.*- සියලුම ලංසු පත් මුල් පිටපත හා දෙවන පිටපත ලෙස පිටපත් දෙකකින් සකස් කර වෙන් වෙන් කවර දෙකක බහා මුද්‍රා තබා එම කවර දෙක එක් කවරයක බහා මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, තැ. පෙ. 163, සංඝරාජ මාවත, මහනුවර වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය හැක. නැතහොත් කවරයේ බහාලන ලංසුපත් මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ තිබෙන ලංසු පෙට්ටියට දැමිය හැක. සීල් තබන ලද ලංසුපත් බහා එවන කවරයෙහි වම්පස ඉහල කෙලවරෙහි "කිළිටි රෙදි සේදීම - 2011" ලෙස හා කවර ආයතනයක් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය. එමෙන්ම එහි වම් පස පහත කෙලවරේ ලංසුකරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය.

04. *ලංසු පත් භාරගන්නා අවසාන දිනය.*- 2010 දෙසැම්බර් මස 23 දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ. එදිනම පෙ. ව. 11.00ට ලංසුපත් විවෘත කරනු ලැබේ.

05. *ලංසුපත් විවෘත කිරීම.*- ලංසුපත් විවෘත කරන අවස්ථාවේ දී ලංසුකරුට හෝ ඔහුගේ බලය ලත් නිලධාරියෙකුට එම අවස්ථාවට සහභාගි විය හැක.

06. ලංසුවෙහි සඳහන් කරන ලද මිල ගණන්වල වලංගු කාල සීමාව 2011.12.31 වැනි දින දක්වා වේ. ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් සංශෝධනය කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07. *තැන්පත් ඇප මුදල.*- තෝරාගන්නා ලද ලංසුකරු පහත උපලේඛනවල 3 තීරුවේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු ගිවිසුමකට එළඹිය යුතුයි.

08. *ලංසු පිළිබඳ කොන්දේසි.*- ලංසු පිළිබඳ කොන්දේසි ලංසුපත්‍රයෙහි පිටුපස දක්වා ඇත. සියළුම ලංසුකරුවන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම ඒවා පිළිපැදිය යුතු වන්නේ ය.

09. *අනෙකුත් විස්තර :*

(i) කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සඳහා ඒවා එහා මෙහා ගෙන යාමේ වියදම් - යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමුව ඒවායේ විෂබීජ නැති කිරීමට වෙනත් ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිදු ගාස්තුවක් ගෙවනු නොලැබේ. රෝහල් පරිශ්‍රය තුළ රෙදි සෝදන්නේ නම් ඒ සඳහා රෝහලෙන් ලබා ගන්නා ගබඩා පහසුකම් ජලය, විදුලි සඳහා අදාල ස්ථානභාර නිලධාරි විසින් තක්සේරු කර නියම කරන ලද මුදල ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටිය යුතුය.

(ii) ලංසුකරුවන්ට කිසියම් රෝහලක් සඳහා සේවාවේ කොටසක් හෝ මුළු සේවාවම සඳහා ලංසු ඉදිරිපත් කළ හැකිය.

10. මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

වෛද්‍ය ශාන්ති සමරසිංහ,
මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

2010 නොවැම්බර් මස 11 වැනි දින,
තැ. පෙ. 163, සංඝරාජ මාවතෙහි පිහිටි මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

### උපලේඛනය

### 2011 වර්ෂයේ කිළිටි රෙදි සේදීම - මහනුවර දිස්ත්‍රික්කය

| | 1 | 2 | 3 | 4 | 5 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආයතනය | ලංසු පෝරම ගාස්තු | ඇප මුදල් | මසකට සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු කෑලි ගණන | | | | ලංසු භාර ගන්නා අවසාන දිනය |
| | | | | | විශාල | මධ්‍යම | කුඩා | එකතුව | |
| 1. | දි. මූ. රෝහල - නාවලපිටිය | | | | | | | | |
| | ශල්‍යාගාරය | 500 | 1,000 | 10 | මුළු ගණන 7127 | | | | |
| | වාට්ටුව | 500 | 1,000 | 4 | 686 | 28 | 155 | 869 | |
| 2. | දි. මූ. රෝහල - තෙල්දෙණිය | 250 | 500 | 3 | 140 | 30 | 70 | 240 | |
| | ප්‍රාදේශීය රෝහල් : | | | | | | | | |
| 3. | අකුරණ | 250 | 500 | 3 | 100 | 35 | 65 | 200 | |
| | අංකුඹුර | 250 | 500 | 3 | 150 | 50 | 100 | 300 | |
| 4. | දෙල්තොට | 250 | 500 | 3 | 100 | 30 | 70 | 200 | |
| 5. | දොලොස්බාගේ | 250 | 500 | 3 | 60 | 15 | 25 | 100 | |
| 6. | ගලගෙදර | 250 | 500 | 3 | 60 | 15 | 25 | 100 | |
| 7. | මැණික්හින්න | 250 | 500 | 3 | 40 | 20 | 33 | 93 | |
| 8. | මඩොල්කැලේ | 250 | 500 | 3 | 200 | 50 | 150 | 400 | |
| 9. | පුස්සැල්ලාව | 250 | 500 | 3 | 100 | 30 | 50 | 180 | |
| 10. | උඩුදුම්බර | 250 | 500 | 3 | 45 | 10 | 25 | 80 | 2010 දෙසැම්බර් මස 23 වැනි දින පෙ. ව. 10.30ට |
| 11. | කඩුගන්නාව | 250 | 500 | 3 | 65 | 20 | 35 | 120 | |
| 12. | කටුගස්තොට | 250 | 500 | 3 | 100 | 30 | 60 | 190 | |
| 13. | හසලක | 250 | 500 | 3 | 60 | 20 | 32 | 112 | |
| 14. | සංඝරාජපුර | 250 | 500 | 3 | 40 | 10 | 20 | 70 | |
| 15. | මනම්පිටිය | 250 | 500 | 3 | 100 | 30 | 70 | 200 | |
| 16. | මාරස්සන | 250 | 500 | 3 | 125 | 35 | 50 | 210 | |
| 17. | මැදවල | 250 | 500 | 3 | 70 | 20 | 50 | 140 | |
| 18. | මිණිපේ | 250 | 500 | 3 | 50 | 10 | 20 | 80 | |
| 19. | වත්තේගම | 250 | 500 | 3 | 40 | 20 | 30 | 90 | |
| 20. | පන්විලතැන්න | 250 | 500 | 3 | 30 | 15 | 25 | 70 | |
| 21. | තිත්තපජ්ජල | 250 | 500 | 3 | 65 | 10 | 25 | 100 | |
| 22. | අළුත්ගම ජම්බුගහපිටිය | 250 | 500 | 3 | 50 | 20 | 20 | 90 | |
| 23. | අඹගහපැලැස්ස | 250 | 500 | 3 | 90 | 30 | 60 | 180 | |
| 24. | බටුමුල්ල | 250 | 500 | 3 | 55 | 25 | 35 | 115 | |
| 25. | බඹරදෙණිය | 250 | 500 | 3 | 30 | 15 | 25 | 70 | |
| 26. | බොක්කාවල | 250 | 500 | 3 | 30 | 15 | 25 | 70 | |
| 27. | ගලහා | 250 | 500 | 3 | 20 | 5 | 15 | 40 | |
| 28. | ගල්පිහිල්ල | 250 | 500 | 3 | 70 | 20 | 30 | 120 | |
| 29. | ගෙලිඔය | 250 | 500 | 3 | 60 | 15 | 25 | 100 | |
| 30. | හතරලියද්ද | 250 | 500 | 3 | 35 | 15 | 20 | 70 | |
| 31. | කහවත්ත | 250 | 500 | 3 | 15 | 5 | 10 | 30 | |
| 32. | කොළොන්ගොඩ | 250 | 500 | 3 | 30 | 15 | 30 | 75 | |
| 33. | කොටලිගොඩ | 250 | 500 | 3 | 100 | 30 | 70 | 200 | |
| 34. | කුරුඳුවත්ත | 250 | 500 | 3 | 75 | 15 | 30 | 120 | |
| 35. | මැදමහනුවර | 250 | 500 | 3 | 25 | 15 | 25 | 65 | |
| 36. | මොරහේන | 250 | 500 | 3 | 40 | 10 | 10 | 60 | |
| 37. | නාරම්පනාව | 250 | 500 | 3 | 65 | 30 | 45 | 140 | |
| 38. | පමුණුව | 250 | 500 | 3 | 60 | 15 | 25 | 100 | |
| 39. | තලාතුඔය | 250 | 500 | 3 | 60 | 15 | 25 | 100 | |

**2011 වර්ෂයේ කිළිටි රෙදි සේදීම - මහනුවර දිස්ත්‍රික්කය**

| | 1 | 2 | 3 | 4 | 5 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආයතනය | ලංසු පෝරම ගාස්තු | ඇප මුදල් | මසකට සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු කෑලි ගණන | | | | ලංසු භාර ගන්නා අවසාන දිනය |
| | | | | | විශාල | මධ්‍යම | කුඩා | එකතුව | |
| 40. | උඩගම අටබාගේ | 250 | 500 | 3 | 15 | 5 | 10 | 30 | 2010 දෙසැම්බර් මස 23 වැනි දින පෙ. ව. 10.30ට |
| 41. | උඩුවෙල | 250 | 500 | 3 | 70 | 20 | 40 | 130 | |
| 42. | වට්ටප්පල | 250 | 500 | 3 | 75 | 15 | 30 | 120 | |
| 43. | යග්ගහපිටිය | 250 | 500 | 3 | 20 | 10 | 10 | 40 | |
| 44. | දුන්හින්න | 250 | 500 | 3 | 15 | 5 | 10 | 30 | |
| 45. | උලපනේ | 250 | 500 | 3 | 40 | 10 | 10 | 60 | |
| 46. | පට්ටියගම පල්ලේගම | 250 | 500 | 3 | 30 | 15 | 25 | 70 | |
| 47. | මුරුතලාව | 250 | 500 | 3 | 75 | 15 | 30 | 120 | |
| 48. | වෙස්ට්හෝල් - නාවලපිටිය | 250 | 500 | 3 | 30 | 15 | 25 | 70 | |
| 49. | දිගන පුනරුත්ථාපන රෝහල | 250 | 500 | 3 | 450 | 30 | 20 | 500 | |

**උපලේඛනය II**

**2011 වර්ෂයේ කිළිටි රෙදි සේදීම - මාතලේ දිස්ත්‍රික්කය**

| | ආයතනය | ලංසු පෝරම ගාස්තු | ඇප මුදල් | මසකට සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු කෑලි ගණන | | | | ලංසු භාර ගන්නා අවසාන දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | විශාල | මධ්‍යම | කුඩා | එකතුව | |
| 1. | දිස්ත්‍රික් මූලික රෝහල - මාතලේ | | | | | | | | 2010 දෙසැම්බර් මස 23 වැනි දින පෙ. ව. 10.30ට |
| | ශල්‍යාගාරය | 500 | 1,000 | 30 | 3224 | 8848 | 216 | 12,288 | |
| | වාට්ටුව | 500 | 1,000 | 4 | 3133 | 623 | 128 | 3884 | |
| 2. | දිස්ත්‍රික් මූලික රෝහල - දඹුල්ල | | | | | | | | |
| | ශල්‍යාගාරය | 500 | 1,000 | 30 | 1528 | 6116 | - | 7644 | |
| | වාට්ටුව | 500 | 1,000 | 4 | 1,300 | 1,452 | 112 | 2864 | |
| | ප්‍රාදේශීය රෝහල් : | | | | | | | | |
| 3. | රත්තොට | 250 | 500 | 4 | 387 | - | 37 | 424 | |
| 4. | ගලේවෙල | 250 | 500 | 4 | 369 | - | 39 | 408 | |
| 5. | ලග්ගල, පල්ලේගම | 250 | 500 | 4 | 317 | - | 75 | 392 | |
| 6. | හෙට්ටිපොල | 250 | 500 | 4 | 45 | - | 5 | 50 | |
| 7. | මාදිපොල | 250 | 500 | 4 | 130 | - | 19 | 149 | |
| 8. | ඕවිලිකන්ද | 250 | 500 | 4 | 250 | - | 100 | 350 | |
| 9. | නාලන්ද | 250 | 500 | 4 | 250 | - | 100 | 350 | |

**උපලේඛනය III**

**2011 වර්ෂයේ කිළිටි රෙදි සේදීම - නුවරඑළිය දිස්ත්‍රික්කය**

| | ආයතනය | ලංසු පෝරම ගාස්තු | ඇප මුදල් | මසකට සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු කෑලි ගණන | | | | ලංසු භාර ගන්නා අවසාන දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | විශාල | මධ්‍යම | කුඩා | එකතුව | |
| 1 | දිස්ත්‍රික් මූලික රෝහල දික්ඔය | | | | | | | | 2010 දෙසැම්බර් මස 23 වැනි දින පෙ. ව. 10.30ට |
| | වාට්ටුව | 500 | 1,000 | 3 | 375 | 50 | 25 | 450 | |
| | ශල්‍යාගාරය | 500 | 1,000 | 3 | 500 | 1,000 | 500 | 2,000 | |
| 2 | දිස්ත්‍රික් මූලික රෝහල - රිකිල්ලගස්කඩ | 500 | 1,000 | 3 | 550 | 50 | 50 | 650 | |
| | *ප්‍රාදේශීය රෝහල් :* | | | | | | | | |
| 3 | වලපනේ | 250 | 500 | 3 | 300 | 50 | 25 | 375 | |
| 4 | උඩුපුස්සැල්ලාව | 250 | 500 | 3 | 250 | 25 | 25 | 300 | |
| 5 | මස්කෙළිය | 250 | 500 | 3 | 250 | 25 | 25 | 300 | |
| 6 | ආගරපතන | 250 | 500 | 3 | 150 | 25 | 25 | 200 | |
| 7 | ලිඳුල | 250 | 500 | 3 | 300 | 25 | 25 | 350 | |
| 8 | වටවල | 250 | 500 | 3 | 250 | 25 | 25 | 300 | |
| 9 | රම්බොඩ කොත්මලේ | 250 | 500 | 3 | 200 | 25 | 25 | 250 | |
| 10 | බගවන්තලාව | 250 | 500 | 3 | 375 | 35 | 20 | 430 | |
| 11 | කොටගල | 250 | 500 | 3 | 200 | 25 | 25 | 250 | |
| 12 | මතුරට | 250 | 500 | 3 | 300 | 25 | 25 | 350 | |
| 13 | මල්දෙණිය | 250 | 500 | 3 | 200 | 25 | 25 | 250 | |
| 14 | ලක්ෂපාන | 250 | 500 | 3 | 85 | 10 | 5 | 100 | |
| 15 | ගිණිගත්හේන | 250 | 500 | 3 | 200 | 25 | 25 | 250 | |
| 16 | හඟුරන්කෙත | 250 | 500 | 3 | 150 | 25 | 25 | 200 | |
| 17 | ඩයගම | 250 | 500 | 3 | 125 | 15 | 10 | 150 | |
| 18 | ගෝනපිටිය | 250 | 500 | 3 | 125 | 15 | 10 | 150 | |
| 19 | උතුරුමැද කුඹුර | 250 | 500 | 3 | 60 | 10 | 5 | 75 | |
| 20 | හයිෆොරස්ට් | 250 | 500 | 3 | 125 | 15 | 10 | 150 | |
| 21 | ගෝනගන්තැන්න | 250 | 500 | 3 | 85 | 15 | 10 | 110 | |
| 22 | මුල්ඔය | 250 | 500 | 3 | 50 | 15 | 10 | 75 | |
| 23 | ප්‍රාථමික වෛද්‍ය ඒකකය | | | | | | | | |
| 24 | නිල්දණ්ඩාහින්න | 250 | 500 | 3 | 50 | 15 | 10 | 75 | |
| 25 | මන්දරාම්නුවර | 250 | 500 | 3 | 50 | 5 | 5 | 60 | |
| 26 | තෙරිපැහැ | 250 | 500 | 3 | 25 | 15 | 10 | 50 | |
| 27 | මඩුල්ල | 250 | 500 | 3 | 25 | 15 | 10 | 50 | |
| 28 | ළය චිකිත්සාගාරය, නු. එළිය | 250 | 500 | 3 | 25 | 10 | 5 | 40 | |
| 29 | සෞ. වෛ. නි. කා. අඹගමුව | 250 | 500 | 3 | 25 | 10 | - | 35 | |
| 30 | සෞ. වෛ. නි. කා. රිකිල්ලගස්කඩ | 250 | 500 | 3 | 25 | 10 | - | 35 | |
| 31 | සෞ. වෛ. නි. කා. කොත්මලේ | 250 | 500 | 3 | 25 | 10 | - | 35 | |

11-819

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.